සියලු ම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Department of Education, Southern Province Department of Education, Southern Province Department of Educ

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Department of Education, Southern Province

## තෙවන වාර පරීක්ෂණය - 2020
## Third Term Test - 2020

| | | |
|---|---|---|
| 11 ශ්‍රේණිය<br>Grade 11 | සිංහල සාහිත්‍ය රසාස්වාදය | පැය තුනයි<br>Three hours |

**අමතර කියවීම් කාලය මිනිත්තු 10 යි.**

සැලකිය යුතුයි.

- අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කිරීමටත් යොදන්න.
- **I** කොටසෙහි **01, 02** ප්‍රශ්නවලටත්, **II** කොටසෙහි **03** වැනි ප්‍රශ්නයටත්, **III** කොටසෙහි **04, 05, 06, 07** ප්‍රශ්නවලින් තෝරා ගත් ප්‍රශ්න දෙකකටත් පිළිතුරු සපයන්න.

---

## I කොටස

01 (i) සිට (v) තෙක් ඇති කොටස් කියවා ඒවා ඇසුරින් අසා ඇති (අ), (ආ) ප්‍රශ්නවලට කෙටි පිළිතුරු ලියන්න.

(i) ''එතෙම අතවැස්සෙක් නො වෙයි, තොපට ඇදුරුකමට නිසි ය.''

(අ) මෙම ප්‍රකාශය කවුරුන් විසින් කරන ලද්දේ ද?

(ආ) මෙහි අතවැස්සෙක් ලෙස හැඳින්වූයේ කවරෙක් ද?

(ii) විපුල ගුණැති මහතුන් හට පත් විපත
නිසල නැණින් යුතු උතුමෝ ම දුර ලත
**කලල** ගිලුණු මත **වරණිඳු** ගොඩ ගනුත
තුමුල බලැති ගිජිඳකු මිස අන් කෙවත

(අ) තද කළු අකුරින් මුද්‍රිත පදවල අර්ථය ලියන්න.

(ආ) ''තුමුල බලැති ගිජිඳකු මිස අන් කෙවත'' යන්නෙහි අර්ථය පැහැදිලි කරන්න.

(iii) ''පියරු දූම්මට මුහුණේ ගඳ යනවාද ?''

(අ) මෙම ප්‍රකාශය කිරීමට හේතු වූ හැඟීම කුමක් ද?

(ආ) මෙම ප්‍රකාශය විඳින අය ඊට ප්‍රතිචාර දක්වූයේ කෙසේ ද?

(iv) ''එසේ හෙයින් තොප කීවත් නොකීවත් අපි ඒ ඇපයෙන් මිදුණුම්හ.''

(අ) මෙම ප්‍රකාශය කවුරුන් විසින් කරන ලද්දේ ද?

(ආ) මෙම ප්‍රකාශය ඇතුළත් කෘතිය රචනා කරන ලද සාහිත්‍ය අවධිය කුමක් ද?

(v) ''මෙයත් පහු උනු දවස් ටිකේ දිගටම වාගේ අසනීප ගානේ''

(අ) මෙම ප්‍රකාශයෙ ඇතුළත් ''මෙයත්'' යනුවෙන් හැඳින්වෙන්නේ කවරෙක් ද?

(ආ) මෙම ප්‍රකාශය කිරීමේ අරමුණ කුමක් ද?

(ලකුණු 4 × 5 = 20 යි)

02 පහත සඳහන් පැදි පෙළ කියවා, දී ඇති ප්‍රකාශ උපයෝගී කොට ගෙන **රසාස්වාදයක්** ලියන්න.

එක් යුගයක ජීවනයේ සරතස නිවූ මා සුමිතුර
දුර හිඳිනා ඔබ දකින්න ආයෙමි දිගු කලකට පසු

බමන විදුලි පංකාවෙන් වා ගැබ කැළඹෙන හඬ මිස
එ සඳ ඔබේ මුව'ග නැගුණු සාද තෙපුල් නෑසේ මට

මේසය මත ලිපි ගොනු රැස් සුළඟෙ නොයා දී රකිමින්
ඒ මත හිඳිනා ගල සේ මා අබියස නිහඬය ඔබ

බිත්තියේ ඇති සේයා රූ එකිනෙක එබී එබී බලයි
නැතියෙන් ඔබෙ වත හසරැලි මදෙස බලා සිනා නගයි

බාලේ අපි ගම් දොර කෙළි මඩුලු මැදින් ආ ගමනේ
මහදේ ඇඳි ඔබ සිතුවම කොහි සැඟවිණි දැයි නොදනේ

එක යුගයක ජීවනයේ සරතස නිවූ මා සුමිතුර
ඔබ අසලින් බැහැරට යමි කුමට ද ඔබගේ අවසර ?

(i) මෙම පැදි පෙළට පාදක වූ අත්දැකීම
(ii) කිවිඳිය සතු පරිකල්පන ශක්තිය
(iii) මෙම පද්‍ය නිර්මාණයේ දී යොදාගත් කාව්‍යෝක්ති
(iv) යොදා ගත් භාෂාව හා ආකෘතිය
(v) පැදි පෙළට යොදා ගත් දෘෂ්ටි කෝණයේ සාර්ථකත්වය

(ලකුණු 25 යි)

## II කොටස

- පහත සඳහන් ගද්‍ය - පද්‍ය කොටස් දෙකෙන් **එක කොටසකට පමණක්** පිළිතුරු සපයන්න.

(03) කුස රජ්ජුරුවෝ එතැන් පටන් ප්‍රභාවතීන් නො දක්නාහු ය මා කෙරෙහි ප්‍රභාවතීන් ස්නේහ ඇති නැති බව පරීක්ෂා කෙරෙමි සිතා එක් දවසක් රාජ කුමාරිකාවරුන් බත් කවා වළන් කද ගෙන යමින් ප්‍රභාවතීන්ගේ දොර සමීපයෙහි අඩි ඇන වළන් අඬවා පැකිල වැටී හී කෙඳිරි ගාමින් ඔත්තාහු ය. එකල ප්‍රභාවතී බෝධිසත්ත්වයන්ගේ කෙඳිරි ගැවිලි අසා ගෙයි දොර ඇර බලා කද කර තබා ගෙන වැද හොත්තවුන් දැක ''මුන්වහන්සේ මුළු දඹදිවට අග්‍රරාජයන් සේක. මා නිසා රෑ දාවල් දුක් විඳිමින් සිවුමැලි බැවින් වසුන් කද බරින් මැඩී වැටී ගිය සේක. ඉදින් අමුත්තෙක් වී නම් මට මීට වඩා වැරද්දෙක් නැත. ප්‍රාණය ඇද්ද නැද්දැයි පරීක්ෂා කෙරෙමි''යි සිතා භය ගෙන ගෙන් පිටත්ව බෝධිසත්ත්වයන්ගේ ශ්වාසය පරීක්ෂා කරනු පිණිස නැඹුරුව මුහුණ බැලුව. එසඳ කුස රජ්ජුරුවෝ කෙළ කටක් පුරාගෙන ප්‍රභාවතීන් මුහුණට දැමූහ. එකල ප්‍රභාවතී බැණ දොඩා ගොස් ගෙට වැද දොර අඩවලු කොට ''රජ්ජුරුවන් වහන්ස, යමෙක් විරූපීව රූ ඇත්තන් ප්‍රාර්ථනා කරේ ද නො කැමතියන් කැමති වේද ඕ හට අවැඩ වන්නේය'' යනාදීන් ප්‍රභාවතීන් විසින් නොයෙක් ලෙස බැණ දොඩා පරිභව කළත් බෝධිසත්ත්වයෝ උන් කෙරේ නො කලකිරී ''එම්බා ප්‍රභාවතිනි, මේ ලෝකයෙහි යම් පුරුෂයෙක් ලෝකාස්වාදරතී වශයෙන් තමා නොකැමති වූ ද ස්ත්‍රියගෙන් දර්ශනය ස්පර්ශය සම්භාෂණය සම්භෝගයයි යන මෙයින් එක්තරා සන්තෝෂ කාරණයක් ලැබේ ද එසේ ලබන ලද ලාභය මනා වූ ලාභයකැයි ප්‍රශංසා කරම්හ. තමා නොකැමතිවත් ස්ත්‍රිය කෙරෙන් ප්‍රීතියක් නො ලැබීම නපුරු වන්නේ ය. එහෙයින් තොපගේ දර්ශනය ලාභා දී ඓශ්වර්ය විඳිමින් මෙහි ම වාසය කෙරෙමී'' කීහ.

බෝධිසත්ත්වයන් මෙලෙස කී කල්හිත් ප්‍රභාවතී මඳකුත් පසු නො බැස තද කොට ම කියා මොහු පලවම් සිතා මඳකුත් ස්නෙහරති වශයෙන් නොකැමැත්තවුත් මා කෙරෙහි පිළිබඳ සිතින් කැමතිව වයන්නා වූ තෙපි පිපාසාවෙන් පීඩිතව බොළඳකමින් කිහිරි උලක් ඇරගෙන ගල් පොත්තක් කැණ පැන් හැරගන්නා කැමතියක් හු ද ඝර්මයෙන් පීඩිතව දූලක් බැඳ සුළන් රඳවන්නක්හු හා ද සමානය'' යනාදීන් තද පරුෂ බස් කියා දෙඩුව.

එබස් අසා කුසරජ්ජුරුවෝ ''චාටු මනෝඥ වූ අංගප්‍රත්‍යාංගාදී ස්ත්‍රී සෞභාග්‍යයෙන් යුක්ත වූ ප්‍රභාවතීනි, අනේක කෝටි හා නාටක ස්ත්‍රීන් හා අනන්ත සාමන්තචක්‍ර මෞලිමාලලාලිත පාද පීඨ ඇති රාජ්‍ය ශ්‍රී ද හැර තොප කෙරෙහි බැඳුණු සිතින් නො රටට පැමිණ දුක් විඳිමින් තොප හා සමග ප්‍රේමාන්ත වූ කථා සම්භාෂණ මාත්‍රයකුත් නොලද්දා වූ මම භාවභාවලීලාකටාක්ෂ නිරීක්ෂණ මන්දස්මිත මධු මධුරභාෂිතා දී සෞභාග්‍යයෙන් යුක්ත කෝමලාංග ඇති තොපගේ ළය ගලකින් කරන ලැදැයි සිතමි. තව ද ප්‍රභාවතීනි, තෙපි යම් පමණ කලක් කෝපයෙන් බැම බිඳ රූෂ්ට ව බලන්නී ද ඒතාක් මදු රජ්ජුරුවන්ගේ මේ භවනෙහි දුක් විඳිමින් අරක්කැමිව වාසය කෙරෙමි.

(i) පූර්වෝක්ත ඡේදයෙන් කියැවෙන කුස රජු ප්‍රභාවතීන් කෙරෙහිත් පබාවතී කුස රජු කෙරෙහිත් ඇති ආකල්පය කුමක් ද? (ලකුණු 05 යි)

(ii) කුස රජතුමා කෙරෙහි පබාවතීන් තුළ ඇති නොකැමැත්ත උපමා කරමින් කරන ලද ප්‍රකාශ ඡේදය තුළින් උපුටා දක්වන්න. (ලකුණු 05 යි)

(iii) පුරුෂයන්ගේ සතුට කෙරෙහි ස්ත්‍රීන්ගෙන් අපේක්ෂිත කරුණු ලෙස කුස රජු දකින්නේ මොනවා ද? (ලකුණු 05 යි)

(iv) කුස රජු විසින් ප්‍රභාවතීන් වර්ණනා කර ඇති ආකාරය මෙම ඡේදය ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 10 යි)

(මුළු ලකුණු 25)

**නැතහොත්**

ගොඩේ කන්දේ මුකලාන කම්පා කරමින්නේ
රූස්සයෙකි රෑ පාළුව බිඳගෙන ඇද වැටුණේ
අඩ නින්දෙ ම පන් පැදුරට උණු කඳුළක් හැලුණේ
මූකලාන පස් වැටියක් වී හීනෙන් පෙනුණේ

යස දරුවන් ගෙන ඇකයෙන් කැපුවත් නොසැලෙන්නේ
දුක් කරදර කෝටියක් ම ගිලගෙන හිනැහෙන්නේ
සියතින් මර විපත කටින මිනිසුන් දකිමින්නේ
මහා පුරුෂයකු වාගේ කන්ද නැගී ඉන්නේ

පිරුණු ලොරිය ගම් දොරකඩ පියමං කර යනවා
පාර වුණත් හිරිහැරයක් නෑ ඔහෙ නිදියනවා
පැලේ වහල ඇද හැලිලා මාසයක් ම වෙනවා
පරාල තුනකට අයියා හිරේ හුහුං ලනවා

පොරව, කියත කලුවරේ ම පණ ආවා                    ලෙසිනේ
මගේ ඇඟ උඩ පට්ටල් බැඳ කපනු ඉරනු                    වැන්නේ
දෙයියන්ගේ මල්ලිලාට දෙවියො ම                    රැවටෙන්නේ
කාන්තාර ගම් මායිම් තවත් පුළුල්                    වෙන්නේ

(i) මෙම පද්‍ය පන්තියේ දී කවියා කම්පනයට පත් වන්නේ කුමන කරුණු පදනම් කරගෙන ද ? (ලකුණු 05 යි)

(ii) අජීවී පරිසරය සජීවීකරණයට කවියා යොදාගත් කාව්‍යමය යෙදුම් මොනවා ද ? (ලකුණු 05 යි)

(iii) මෙම පද්‍ය සරල අනුභූතියකින් වුව ද ඉන් ඉස්මතුවන ගැඹුරු සමාජ දෘෂ්ටිය කුමක් ද ?

(ලකුණු 05 යි)

(iv) ආත්මාර්ථකාමී හැඟීම් මත සොබා දහමේ පැවැත්මට වන හානිය අපූර්වත්වයෙන් ඉදිරිපත් කිරීමට මෙම පද්‍ය පන්තිය සමත් වී ඇත. විමසන්න. (ලකුණු 10 යි)

(මුළු ලකුණු 25 යි)

## III කොටස

- මෙම කොටසින් **ප්‍රශ්න දෙකකට පමණක්** පිළිතුරු සපයන්න (**පිළිතුර වචන 150 ට නොඅඩු විය යුතුය.**)

04. ''ගැඹුරු දහමක් රසවත් කතාවක් තුළින් ඉස්මතු කිරීමට සද්ධර්ම රත්නාවලී කතුවර හිමියෝ සමත් වෙති.'' නන්ද තෙරුන් වහන්සේගේ කතා වස්තුව ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 15 යි)

05. ''කලාත්මක කෙටි කතාවක් ලෙස ''වෙසක් පහන'' අවස්ථා හා සිද්ධි නිරූපණය සජීවී අන්දමින් චිත්ත රූප මැවීමට සමත් ය.'' පැහැදිලි කරන්න. (ලකුණු 15 යි)

06. පවතින සමාජ ක්‍රියාවලිය හා බැඳුණු සත්‍යයය විශ්වසනීයත්වයෙන් විවරණය කිරීමට තුංමංහන්දිය නවකතා කතුවරයා දක්වූ සාමර්ථ්‍යය අගයන්න. (ලකුණු 15 යි)

07. අසීමිත නිදහසකින් එහෙත් නිරවුල්ව හා රසවත්ව සිය සිතුවිලි කවියට නැඟීමට ජනකවියා සමත් වී ඇත. නිර්දිෂ්ට ජන කවි ඇසුරින් විමසන්න. (ලකුණු 15 යි)

(ලකුණු 15 × 2 = 30 යි)

## පිළිතුරු පත්‍රය

01 (i) (අ) මදු රජු, රජතුමා
(ආ) කුසරජතුමා
(ii) (අ) කලල - මඩ / වරණිඳු - ඇත් රජු
(ආ) මහත් බල ඇති ඇත් රජකු මීස වෙන කවරෙක් සමත් වේ ද ?
(iii) (අ) ඊර්ෂ්‍යාවක්
(ආ) කෝපවී
(iv) (අ) බුදුන්වහන්සේ
(ආ) දඹදෙණි සාහිත්‍ය අවධිය
(v) (අ) කථකයා / ආර්. ඒ සිරිසේන / ඩේවිඩ් සිංඤෝ
(ආ) ජුවානිස් ආතාගේ හිත වෙනස් කිරීම (4 × 5 = 20)

### II කොටස

(02) රසාස්වාදය සලකා බලා ලකුණු ලබා දෙන්න. (ලකුණු 25)

(03) (i) ගෞරවය හා සෙනෙහස (ලකුණු 05)
(ii) පිපාසාවෙන් පීඩිතව බොළඳකමින් කිහිරි උලක් ඇරගෙන ගල් පොත්තක් කැණ පැන් ගන්නා කැමතියක් හු සර්මයෙන් පීඩිතව දූලක් බිඳ සුළක් රඳවන්නක්හු (ලකුණු 05)
(iii) දර්ශනය, ස්පර්ශය, සම්භාෂණය, සම්භෝගය (ලකුණු 05)
(iv) ප්‍රභාවතීන්ගේ ශරීරාංග හා ඇය කෙරෙන් දක්නට ලැබෙන චර්යාවල සිත් ගන්නා ස්වාභාවය කුස රජු දකින ආකාරය හා ඔහු ගේ කැප කිරීම විස්තර කළ යුතුය. (ලකුණු 10)
(මුළු ලකුණු 25)

නැතහොත්

(i) වනාන්තරය අහිමි වීම.
ගසක පෞරුෂය ගැන සිතීම.
නිර්ධානයන් අසාධරණයට ලක් වීම
ධනේශ්වරයන්ගේ කුහකත්වය දැක්වීම. (ලකුණු 05)
(ii) මූකලාන කම්පා කරමින්නේ රූස්සයෙක්
පන් පැදුරට උණු කඳුලක්
යස දරුවන් ගෙන ඇතයෙන් ගෙන කැපුවත්
මගේ ඇඟ උඩ පට්ටල් බැඳ වැනි යෙදුම් (ලකුණු 05)
(iii) නිර්ධන හා ධනේෂ්වර විෂමතාව (ලකුණු 05)
(iv) පරිසරය වැනසීම මිනිසාගේ ද විනාශයට හේතුවන බව නිර්ධනයන් තම පැවැත්ම සඳහා සිදු කරන සාමාන්‍ය ක්‍රියාවලිය ධනේෂ්වරයන් මුදල්මත ලාභ ඉපයීම පරමාර්ථ කරගෙන වනාන්තර විනාශ කරන බව හා කවියා එය කරන ආකාරය සහ තවත් කරුණු ඉදිරිපත් කළ යුතුය. (ලකුණු 10)
(මුළු ලකුණු 25)

### III කොටස

04. කතුවරයාට ම ආවේණික සරල සුගම ගීතවත් බස්වහරකින් රචිත අවස්ථෝචිත උපමාලංකාර ආදීයෙන් පොෂිතව සියලු මංගල්‍යයන්ට වඩ නිවන් මංගල්‍ය උතුම් බව යන ගැඹුරු දහම ඉදිරිපත් කරන ආකාරය උදාහරණ දක්වමින පැහැදිලි කළ යුතු ය. (ලකුණු 15)

05. අයියා කථිකයා හා නංගී සමග වෙසක් පහන සැදූ ආකාරය කථිකයා හා නංගී අතර කලහය වෙසක් පහනට ගිණි ඇවුලුණු අවස්ථාව අයියා මිය යයි සිතා බිය වීම ආදී අවස්ථා ද පදනම් කරගෙන තවත් කරුණු දැක්විය යුතු ය. (ලකුණු 15)

06. සිංහල ගැමි සංස්කෘතිය තුළ පවත්නා පුරුෂාර්ථ ස්ත්‍රී පුරුෂ චරිත ස්වභාවයෙන් ඔවුන්ගේ රුචි අරුචිකම් සිතුම්පැතුම් හොඳ නොහොඳ යථාර්ථවත්ව හා විශ්වාසනීයත්වයෙන් ඉදිරිපත් කිරීම පිළිබඳ කරුණු දැක්විය යුතුය. (ලකුණු 15)

07. විදග්ධ කවියා අනුගමනය කළ විවිධ කාව්‍ය රීතිවලින් බැහැරව ජීවිතයේ විවිධ අවස්ථා පදනම් කරගෙන ජීවිත පරිඥානය විදහා දක්වෙන පරිදි රසයෙන් අනූන නිරවුල් කවි සංකල්පනා බිහි කළ ආකාරය පැහැදිලි කළ යුතුය. (උදාහරණ සහිතව) (ලකුණු 15)

(මුළු ලකුණු 15 x 2 = 30)

අපොස සා/පෙළ පසුගිය විභාග ප්‍රශ්නෝත්තර වට්ටම් සහිතව ගෙදරටම ගෙන්වාගැනීමට

www.lol.lk
Learn Ordinary Level

LOL.lk online Book Store

අමතන්න - 071 777 4440/0756999990/071 8540371




# LOL.lk
online Book Store

071 777 4440/0756999990/071 8540371

## පළාත් ප්‍රශ්න පත්‍ර සහ පිළිතුරු පත්‍ර පොත්




## ආදර්ශ ප්‍රශ්න පත්‍ර සහ පිළිතුරු පත්‍ර පොත්




## කෙටි සටහන් පොත්




වට්ටම් සහිතව ගෙදරටම ගෙන්වාගැනීමට

**www.lol.lk**

**Learn Ordinary Level**

අමතන්න - 071 777 4440/0756999990/071 8540371

PAST PAPERS WIKI

ප්‍රශ්නපත්‍ර පොත්
ගෙදරටම ගෙන්ව ගන්න
ඔන්ලයින් ඕඩර් කරන්න
WWW.LOL.LK
වෙත යන්න

BUY NOW

Secure Payments By PayPal
NO PAYPAL ACCOUNT NEEDED!

ONLINE
BOOK STORE

An evening of fun for young readers

